සිනෝල්ංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ් -2019
------------------------------------------------------------

**1.1** මතය
------

සිනෝල්ංකා හොටෙල් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ් ("සමාගම") හි 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ හා වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.
2019 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

කරුණු අවධාරණය කිරීම

මාගේ මතය තත්ත්වාගණනය කිරීමකින් තොරව, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අඛණ්ඩ පැවැත්ම උපකල්පනය පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල සටහන 2.7 වෙත මම අවධානය යොමු කරවමි. ඉහත සටහනේ දක්වා ඇති පරිදි, සමාගමේ කළමනාකාරිත්වය විසින් සමාගම අඛණ්ඩව පවත්වාගෙනයාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර අපේක්ෂා කළ හැකි අනාගතයක් සඳහා ව්‍යාපාරය කරගෙනයාමට එයට සම්පත් ඇති බවට සෑහීමට පත්වේ. තවද, අඛණ්ඩව පවත්වාගෙනයාමේ සමාගමේ හැකියාව පිළිබඳව සැලකිය යුතු සැකයක් ඇතිකළ හැකි ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් පිළිබඳ කළමනාකාරිත්වය නොදැන සිටියි. මීට අමතරව, සමාගම රජය සතුවන අතර එය රජයේ උපාය මාර්ග මත රඳා පවතින හෙයින්, රටේ මෑත කාලීන දේශපාලන වෙනස්කම් සැලකිල්ලට ගෙන, යෝජිත හෝටල් ව්‍යාපෘතිය පවත්වාගෙනයාමට සහාය දැක්වෙන උපාය මාර්ගික නියෝගයන් අමාත්‍ය මණ්ඩලය විසින් නිකුත් කරනු ලබාවි යන්න පිළිබඳව කළමනාකාරිත්වය සුබවාදී වේ.

**1.2** මතය සඳහා පදනම
------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්
------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම, අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීම ද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**2018** අංක **19** දරන ජාතික විගණන පනතේ **16(1)** වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම, වැරදි නියෝජනය හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැළසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා

ප්‍රමාණාත්මකව සැළසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩල විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව සමාගම කටයුතු කර ඇති බව,

- සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව

**1.5 ශ්‍රී ලංකා ගිණුම්කරණ / මූල්‍ය වාර්තාකරන ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 "වත්කම් හානිකරණය" (LKAS 36) හි 9 වන ඡේදයට අනුව, අස්තිත්වයක් සෑම වාර්තා කරන කාලපරිච්ඡේදයක් අවසානයේදී වත්කමක හානිකරණය වී ඇති බවට කිසියම් හෝ ඇඟවීමක් කිරීමක් ඇද්ද යන්න පිළිබඳව තක්සේරුවක් කළ යුතුය. එවැනි හැඟවීමක් පවතින්නේ නම් අස්තිත්වය විසින් වත්කමෙහි නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කරනු ලැබේ.<br><br>සමාගම 2019 දෙසැම්බර් 31 දිනට එහි වත්කම් සම්බන්ධයෙන් කිසිදු හානිකරණ තක්සේරුවක් සිදුකර නොමැති බව නිරීක්ෂණය විය. තක්සේරුවක් නොමැතිවීම හේතුවෙන්, 2019 දෙසැම්බර් 31 දිනට එම වත්කම්වල වටිනාකම වෙනස්වී ඇති බව තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් හා උචිත සාක්ෂි ලබා ගැනීමට නොහැකි විය. තක්සේරුවක් කර තිබුණේ නම් එය හඳුනාගත් හානිකරණ ප්‍රතිපාදනය වූ රු. මිලියන 100.6 ට බලපෑ හැකිව තිබුණි. | සමාගම 2019 අප්‍රේල් හානිකරණ තක්සේරුවක් කර ඇති අතර එමඟින් 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල පරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනවලට රු. 2,865,635,579 ක හානිකරණයක් හඳුනාගෙන ඇත. | කළමනාකරණය ප්‍රමිතිය සමඟ අනුකූලවීමට පියවර ගත යුතුය. |
| (ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 (SLFRS 16) - කල් බදු ප්‍රමිතිය අනුව, 2019 ජනවාරි 1 සිට ක්‍රියාත්මක වන පරිදි කල් බදු හිමියකු සියලු කල් බදු ඔහුගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ කල් බදු වගකීම හා අනුරූපී වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ලෙස හඳුනා ගැනීම අවශ්‍ය කෙරේ. | සමාගම, කල්බදු ඉඩම වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ලෙස මූල්‍ය ප්‍රකාශනවලට සටහන් අංක 11 හි හඳුනාගෙන ඇති අතර කල්බදු වගකීම හඳුනාගෙන නැත්තේ එය එක් වර ගෙවීමක් ලෙස නිරවුල් කර ඇති නිසාවෙනි. | කළමනාකරණය ප්‍රමිතිය සමඟ අනුකූලවීමට පියවර ගත යුතුය. |

සමාගම සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමේ හා මෙහෙයවීමේ අරමුණ ඇතිව අවුරුදු 99 ක කාලයක් සඳහා රු. 10,000 ක වාර්ෂික නාමික කල්බද්දක් වෙනුවෙන් තක්සේරු අංක 116 දරන ගාලු පාර, කොළඹ 3 පිහිටි අර්ධ වශයෙන් ඉදිකරන ලද ගොඩනැගිල්ලක් සහිත හෙක්ටයාර් 0.6057 ක ඉඩම් කැබැල්ලක් ලබාගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය සමඟ 2012 ජූලි 16 දිනැති ගිවිසුමකට එළඹ ඇත. වසර 99 කාලය සඳහා නාමික වාර්ෂික කල් බද්ද පියවීම රු.990,000 ක එකවර ගෙවීමක් බව ගිවිසුමේ තව දුරටත් දැක්විණි.

ඉහත දැක්වූ කල්බදු ගිවිසුමට අමතරව, ප්‍රකාශිත දේපළ වෙනුවෙන් සම්පූර්ණ හා අවසාන ප්‍රතිෂ්ඨාව ලෙස සමාගම විසින් රු. බිලියන 5 ක වටිනාකමක් භාණ්ඩාගාර ලේකම්ට ගෙවිය යුතු බවට රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව තීරණය කර තිබුණි. සුඛෝපභෝගී හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමේ හා මෙහෙයවීමේ අරමුණ ඇතිව අවුරුදු 99 ක කාලයක් මත පදනම්ව හෙක්ටයාර් 0.6057 ක ප්‍රමාණයේ ඉඩමට අදාල කළ හැකි වටිනාකම රු. බිලියන 1.228 ක් බව තක්සේරු දෙපාර්තමේන්තුව තවදුරටත් තීරණය කරන ලදි.

මූල්‍ය තත්ව ප්‍රකාශන දිනට කල්බදු වත්කම භාවිතා කිරීමේ අයිතිය සහ කල්බදු වගකීම් සමාගම හඳුනාගෙන නොමැත.

(ඉ) (LKAS 1) ගිණුම්කරණ ප්‍රමිතියෙහි 69 (ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

ඉහත ප්‍රමිතයට පටහැනිව, හෙලන්කෝ හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් වෙතින් සියයට 8.7 ක පොලී අනුපාතයක් යටතේ ලබා ගත් රු. මිලියන 400 (රු. මිලියන 300 ක් 2018 ජනවාරි 12 දින ලබා දී ඇති අතර රු. මිලින 100 ක් 2018 ජනවාරි 18 දින ලබා දී ඇත.) ක ණය මුදල, මූල්‍ය ප්‍රකාශනවල ජංගම වගකීම් යටතේ කෙටි කාලීන ණයක් ලෙස දක්වා තිබුණි.

නිරීක්ෂණය සමඟ එකඟ වේ.

යෝජිත ණය යෝජනා ක්‍රමය හෝ යෝජිත බෙදාහැරීමේ වැඩසටහන මගින් අවශ්‍ය මූල්‍ය පහසුකම් සකස් කර නොතිබූ හෙයින් එම ණය මුදල පියවීමේදී Grand Hyatt ව්‍යාපෘතියට මූල්‍ය දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුවිය.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අවස්ථාවේදී ඒකාකාරී බව පවත්වා ගැනීමට නිවැරදි ගිණුමේ නිවැරදි වටිනාකම් පෙන්වීමට කළමනාකරණය පියවර ගත යුතුය. එසේම, කාලානුරූපී පදනමින් දිගු කාලයක් හිඟව ඇති කෙටි කාලීන ණය පියවීමට පියවර ගත යුතුය.

තවද, සමාගම ණය හෝ එහි පොලිය ආරම්භයේ සිටම හෙලන්කෝර් හොටෙල්ස් ඇන්ඩ් ස්පා ප්‍රයිවට් ලිමිටඩ් වෙත පියවා නොතිබුණි. ගෙවිය යුතු ණය පොලි විස්තර විස්තර පහත දැක්වේ.

| වර්ෂය | පොලී මුදල (රු) |
|---|---|
| **2018** | **33,915,753** |
| **2019** | **35,160,000** |
| එකතුව | **69,075,753** |

**1.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී /12 | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) **2003 ජූනි 2** දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ පීඊඩී **12 -** යහපාලනය සඳහා මගපෙන්වීම හි අංක **9.7** මගපෙන්වීම ප්‍රකාරව, වැටුප් හා දීමනාවන් අනුමත බඳවා ගැනීමේ හා උසස් කිරීමේ යෝජනා ක්‍රම මත පදනම් විය යුතු අතර භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය නොමැතිව සංශෝධනයට අවසර නොදේ.<br><br>සමාගම ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ වැටුප් සඳහා අනුමැතියන් ලබා ගෙන නොතිබුණු අතර අවශ්‍යතාව සමඟ අනුකූල නොවිණි. | සලකා බලනු ලබන කාලසීමාව තුළ සිනෝ ලංකා හොටෙල්ස් ඇන්ඩ් ස්පා (ප්‍රයිවට්) ලිමිටඩ් යටතේ සේවකයන් බඳවා ගැනීමක් සිදු වී නැත. | හිමිකාරිත්ව සමාගමේ සේවාවන් වියදම් බෙදා ගන්නා බැවින් චක්‍රලේඛය සමඟ අනුකූල වීමට කළමනාකරණය පියවර ගත යුතු අතර පරිපාලිත සමාගම්වලට ද එය අනුගමනය කළ යුතුය. |
| (ආ) **2003 ජූනි 2** දිනැතිව නිකුත් කළ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී **12** හි **7.4.5** වගන්තියට අනුව, ස්ථාවර වත්කම් හා ගබඩා අයිතම සත්‍යාපනය කිරීමට වාර්ෂික සමීක්ෂණ මණ්ඩලය හා විශේෂ සමීක්ෂණ මණ්ඩලය පත් කළ යුතුය. සමාගම සමාලෝචිත වර්ෂයේදී, ස්ථාවර වත්කම් සත්‍යාපනය කිරීමට කිසිදු සමීක්ෂණ මණ්ඩලයක් පත්කර නොතිබුණි. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. සමාගම ස්ථාවර වත්කම් සත්‍යාපනය සිදු කර ඇත. කෙසේ වෙතත්, එම සමීක්ෂණ මණ්ඩල පත් කිරීම එම පීඊඩී චක්‍රලේඛවලට අනුකූලවන පරිදි කරනු ලැබේ. | කළමනාකරණය චක්‍රලේඛවලට අනුගතවීමට පියවර ගත යුතුය. |
| (ඇ) **2003 ජූනි 2** දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පීඊඩී **12** හි **5.2.1.** වගන්තියට අනුව, පහත කරුණු ඇතුළත් අයවැයක් පිළියෙල කර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br>• අයවැය ගත ආදායම හා වියදම් ගිණුම<br>• අයවැය ගත ශේෂ පත්‍රය<br>• අයවැය ගත මුදල් ප්‍රවාහ ප්‍රකාශනය | විශේෂ කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතිය, යෝජිත විකිණීමේ වැඩසටහන තුළ පැවති නිසා සමාගමේ කළමනාකරණය එවැනි විකිණීමේ සැළසුමක දිශාවට කටයුතු කර ඇති අතර ඒ අනුව වැඩිදුර ඇස්තමේන්තු සිදු කර නැත. | කළමනාකරණය චක්‍රලේඛවලට අනුගතවීමට පියවර ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,167,235,275 ක අලාභයක් වූ අතර ඉකුත් වර්ෂයේ අනුරූප අලාභය රු. 202,725,525 ක් විය. එබැවින්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.964,509,750 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මූල්‍ය වියදම් හා පරිපාලන වියදම් වැඩිවීම මෙම පිරිහීමට හේතු වී තිබුණි.

### 2.2. ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවණතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක සමාගමේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල සාරාංශයක් පහත වගුවේ දැක්වේ.

| වර්ෂය | 2019 | 2018 | 2017 | 2016 | 2015 |
|---|---|---|---|---|---|
| | Rs | Rs | Rs | Rs | Rs |
| පරිපාලන වියදම් | 139,094,626 | 81,228,313 | 99,427,238 | 114,182,828 | 77,347,552 |
| මූල්‍ය වියදම් | 101,535,458 | 33,915,753 | - | - | - |
| බදු පසු ශුද්ධ අලාභය | (3,167,235,275) | (202,725,525) | (29,768,795) | (50,659,905) | 29,330,349 |

### 2.3. අනුපාත විශ්ලේෂණය

මූල්‍ය ප්‍රකාශන සහ විගණනයට සපයන ලද තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂයේ සමහර වැදගත් අනුපාත ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| අනුපාත | 2019 | 2018 |
|---|---|---|
| ජංගම අනුපාතය | 0.15:1 | 0.17 |
| ක්ෂණික වත්කම් අනුපාතය | 0.12:1 | 0.07 |
| තෝලන අනුපාතය | 0.02:1 | 0.02 |